සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

7034

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

GIT 01 S I, II

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, 2016
பொதுத் தகவல் தொழினுட்பவியல், 2016
General Information Technology Examination, 2016

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය	I, II
பொதுத் தகவல் தொழினுட்பவியல்	I, II
General Information Technology	I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I

වැදගත් :

* **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු** ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයෙහි සපයන්න.
* පිළිතුරු පත්‍රයේ විභාග අංකය සඳහා ඇති ස්ථානයේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, දී ඇති උපදෙස්වලට අනුව ලකුණු කරන්න.

1. 35 නම් දශමය සංඛ්‍යාවට තුල්‍ය වන ද්විමය සංඛ්‍යාව පහත සඳහන් කුමක් ද?
(1) 100001 (2) 100011 (3) 101011 (4) 101010

2 විද්‍යුත් තැපැල් ලිපිනයක් තුළ සැමවිට ම පැවතිය යුතු සංකේතය වන්නේ පහත සඳහන් කුමක් ද?
(1) : (2) @ (3) _ (4) /

3. පහත රූප සටහන සලකා බලන්න.



ඉහත රූප සටහනේ පෙන්වා ඇති ස්ථානීය පෙදෙස් ජාලයේ (LAN) Ⓐ ලෙස නම් කර ඇති උපක්‍රමය (device) වන්නේ පහත සඳහන් කුමක් ද?
(1) දොරටුමග (Gateway) (2) ජාල අතුරු මුහුණත් පත (NIC)
(3) ස්විචය (Switch) (4) මොඩමය (Modem)

4. පහත සඳහන් යෙදුම් පැකේජ සලකා බලන්න:
A - දත්ත සමුදාය යෙදුම් පැකේජ
B - සමර්පණ පැකේජ
C - පැතුරුම්පත් පැකේජ
දත්ත ආචයනයට හා සැකසීමට (process) භාවිත කළ හැක්කේ ඉහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි. (4) A, B සහ C යන සියල්ල ම ය.

5. ඒකාබද්ධ සම්පත් නිශ්චායකය (URL) ක නිවැරදි ආකාරය වන්නේ පහත සඳහන් කුමක් ද?
(1) http:/www.doenets.lk/exam/ (2) http://www.doenets.lk/exam/
(3) html://www.doenets.lk/exam/ (4) http:\\www.doenets.lk\exam\

/දෙවැනි පිටුව බලන්න.